**හොරණ නගර සභාව**
**කළුතර දිස්ත්‍රික්කය**
------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 නොවැම්බර් 19 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය
-------

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට හොරණ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

1:3:1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම
---------------------------------------------------------------

රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 2013 ඔක්තෝබර් 02 දිනැති අංක 3/2013 දරන චක්‍රලේඛය මගින් ප්‍රකාශයට පත් කර ඇති ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 2 අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණිත දිනය වූ 2014 ජුනි 24 වන විටත් වැඩ ආරම්භ කර නොතිබූ ව්‍යාපෘති 2 ක් වෙනුවෙන් රු.324,477 ක් ණයහිමියන් ලෙස ගිණුම්වල ප්‍රතිපාදන සළසා තිබීම නිසා එම වටිනාකමින් වර්ෂයේ වියදම සහ කර්මාන්ත ණයහිමි ශේෂය වැඩියෙන් දැක්විණි.

(ආ) 2013 දෙසැම්බර් 31 දිනට ලේඛන අනුව පැවත එන හිඟ හිටි තානායම් ආදායම් රු.1,119,552 ක් ගිණුම් ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ රු.21,700 කට මිලදී ගෙන තිබූ සිවිලිං විදුලි පංකා 4 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඈ) ඉකුත් වර්ෂයේ ලැබිය යුතු උපාධිධාරී දීමනා හා සේවක ණය පොළී රු.140,330 ක් අත්තිකාරම් ගිණුමට ගිණුම් ගත කර තිබීම නිවැරදි කිරීම සඳහා අත්තිකාරම් ගිණුම හර කර හිඟ හිටි වෙනත් ආදායම් ගිණුම බැර කිරීම වෙනුවට සමුච්චිත අරමුදල හර කර තිබීම නිසා සමුච්චිත අරමුදල ගිණුමේ සහ අත්තිකාරම් ගිණුමේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දැක්විණි.

(ඉ) 2013 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශයේ අභ්‍යන්තර මුදල් මාරු කිරීම් ලෙස ඉදිරියට ගෙන එමින් තිබූ රු.49,117 ක් සම්බන්ධයෙන් මුදල් පොත්වල පැවති වරද නිවැරදි කරනු වෙනුවට පොදු මුදල් ගිණුමෙන් කර්මාන්ත මුදල් ගිණුමට ඉහත වටිනාකමින් චෙක්පතක් ලියා සාවද්‍ය ලෙස අභ්‍යන්තර මුදල් මාරු ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුම බැර කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන කොමසාරිස් විසින් ණය පදනම මත සභාවට ලබා දී තිබූ කැබ් රථය වෙනුවෙන් ගෙවිය යුතු ණය මුදල ගිණුම් ගත කර නොතිබූ අතර එහි වාරික ගෙවීම්ද ප්‍රාග්ධනිත කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
-----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
--------------

ඉදිරිපත් කර තිබූ මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,315,431 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,730,375 ක් විය.

2.2 අක්‍රිය ගිණුම්
----------------

(අ) නාගරික සංවර්ධන අධිකාරිය නමින් විවෘත කර තිබූ බැංකු ජංගම ගිණුම හා මහජන බැංකු ජංගම ගිණුම 2006 වර්ෂයේ සිට අක්‍රියව පැවති අතර එම ගිණුම් දෙකේ පිළිවෙලින් රු.99,885 ක සහ රු.941,985 ක ශේෂයක් උපයෝජනයකින් තොරව පැවතුණි.

(ආ) 1973 දෙසැම්බර් 31 දින ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කොළඹ නගර ශාඛාවේ විවෘත කර තිබූ ඉතිරි කිරීමේ ගිණුමක රු.771,892 ක ශේෂයක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් උපයෝජනයකින තොරව පැවතුණි.

2.3 ආදායම් පරිපාලනය
-------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්
-----------------------------------------------------------------

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 17,916 | 11,351 | 10,263 |
| (ii.) | බදු කුලී | 6,581 | 2,608 | 6,140 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 159 | 159 | -- |
| (iv.) | වෙනත් ආදායම් | 1,175 | 1,123 | 131 |

2:3:2 වරිපනම් බදු
--------------

2013 දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු හිඟ ශේෂය රු.8,929,567 ක් වූ අතර ඉන් 2014 ජූලි වන විට අයකරගෙන තිබුණේ 3,186,665 ක් පමණක් වන අතර හිඟ ශේෂය වන රු.5,742,902 ක් අයකරගෙන නොතිබුණි.

2:3:3 කඩකුලී
-------

(අ) ඉදිරිපත් කර තිබූ උපලේඛන අනුව 2013 හා ඊට පෙර වර්ෂවලට අදාල වූ හිඟ කඩ කුලී ශේෂය රු.2,702,848 ක් වූ අතර ඉන් රු.959,382 ක් 2014 ජූලි වන විටද අයකරගෙන නොතිබුණි. ඉහත හිඟ ශේෂය තුළ 1989 වර්ෂයේ සිට පැවත එන බදුකරුවන් 69 ක ගෙන් අයවිය යුතු රු.426,930 ක කඩ කුලී ශේෂයක්ද විය.

(ආ) බදු දී තිබූ නව සාප්පු සංකීර්ණයේ උත්සව ශාලාවේ බදු ගිවිසුම් කාලය 2011 නොවැම්බර් 30 දිනෙන් අවසන් වී තිබූ අතර බදු ගිවිසුම අළුත් කිරීමට හෝ කාලය දීර්ඝ කිරීමට විගණිත දිනය වූ 2014 ජුනි 19 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) කුලී ආදායම් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය පුරාම කුලී අය කරගෙන නොතිබූ කඩ කාමර 6 ක් තිබූ අතර ඒවායේ හිඟ ශේෂවල එකතුව රු.42,700 ක් විය.

(ඈ) කඩ කාමර 6 ක ගිවිසුම් වලංගු කාලය ඉක්මවා වර්ෂ 2 ත් 28 ත් අතර කාලයක් ගත වී තිබූ නමුත් ඒවා අළුත් කිරීමට විගණිත දිනය වූ 2014 ජූනි 19 වන විටත් කටයුතු කර නොතිබුණි.

2:3.4 ව්‍යාපාර බදු

------------

2013 හා ඊට පෙර වර්ෂයන්ට අදාලව හිඟ ව්‍යාපාර බදු රු.134,160 ක් විගණිත දිනය වූ 2014 මැයි 30 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.5 <u>උසාවි දඩ</u>

1980 අංක 26 දරන ආහාර හා ඖෂධ විධිවිධාන පනතේ විධි විධානයන්ට අනුකූල නොවන ලෙස නගර සභා සීමාව තුළ ආහාර අලෙවිකරන ලද ස්ථානවලට එරෙහිව සභාව විසින් 2012 සිදු කරන ලද වැටලීම් 07 ක් සඳහා රු.69,000 ක දඩ මුදලක් හා 2013 වර්ෂයේ සිදු කරන ලද වැටලීම් 04 ක් සඳහා රු.109,000 ක දඩ මුදලක් නියම කිරීම සම්බන්ධයෙන් සභාවට ලැබිය යුතු සියයට 75 දඩ ආදායම වන රු.133,500 ක මුදල ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3.6 <u>තානායම් ආදායම්</u>

2012 නොවැම්බර් සිට 2013 දෙසැම්බර් දක්වා මාස 14 ක් සඳහා හිඟ තානායම් ආදායම වූ වූ රු.980,000 ක් අයකරගැනීමට විගණිත දිනය වූ 2014 ජූනි 15 දින වන විටත් කටයුතු කර නොතිබුණි. තානායම් ආදායම් සම්බන්ධයෙන් බිල් කිරීම, මුදල් අයවීම හා හිඟ මුදල දැක්වෙන ආකාරයට ලේඛනයක්ද නඩත්තු කර නොතිබුණි.

3. කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

3.1 **කල් ඉකුත් වූ තැන්පතු**

-----------------------------

රු.2,988,644 ක් වූ කල් ඉකුත් වූ තැන්පතු මු.රෙ. 571 විධිවිධාන ප්‍රකාරව නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි.

3.2 <u>**අවිධිමත් ගනුදෙනු**</u>

නගර සභා ආඥා පනතේ 159(ඊ) වගන්තියේ විධිවිධාන අනුව යම් අමාත්‍යවරයාගේ ලිඛිත අනුමැතිය ලබා ගැනීමෙන් තොරව 2013 දෙසැම්බර් 19 දින සභා අනුමැතිය මත ක්‍රීඩා සමාජයක් විසින් පවතවා තිබූ වොලිබෝල් තරඟාවලියක අනුග්‍රාහක දායකත්වය සඳහා රු.100,000 ක මුදලක් සභා අරමුදලින් ගෙවා තිබුණි.

4. පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(i) ගිණුම්කරණය
(ii) ආදායම් පරිපාලනය
(iii) තොග පාලනය
(iv) වත්කම් කළමනාකරණය
(v) ව්‍යාපෘති පරිපාලනය